# බලපත්‍ර කොන්දේසි

1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත අනුව දැනට මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන පහත දැක්වෙන උපදෙස් අනුගමනය කළ යුතුයි.

1.ඔබ වෙත නිකුත් කර ඇති මෙම බලපත්‍රය දී ඇති කාලසීමාව තුළ පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනය පවත්වා ගෙන යාමටත් ඔබට නීත්‍යානුකූලව හිමිකම් ඇත.

2.බලපත්‍රය වලංගු කාලසීමාව අවසන් වීමට මාස 03 ට පෙර සිට ඉදිරි වර්ෂ දෙක සඳහා බලපත්‍ර කාලසීමාව දීර්ඝ කර ගැනීමට අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අදාල තොරතුරු www.defence .lk වෙබ් අඩවියෙන් බාගත හැක.

3.වලංගු කාල සීමාව අවසන්වීමෙන් පසු ලියාපදිංචිය අළුත් කිරීමෙන් තොරව පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනය පවත්වාගෙන යාම 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනතෙහි 15 වන වගන්තිය අනුව දඩුවම් ලැබිය හැකි වරදකි.

4.පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයන්හි අධ්‍යක්ෂක / අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු / හවුල් කාරයෙකු/සේවකයෙකු / නිලධාරියෙකු විසින් මත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම / ගිනි අවි අව භාවිතය / අනුමත නොවන නිල ඇඳුම් භාවිතය / ආදී නීති විරෝධී කටයුතු සම්බන්ධයෙන් අත් අඩංගුවටට පත් වී හෝ සම්බන්ධ වී ඇති බවට කරුණු අනාවරණය වුවහොත් ලියාපදිංචි බලපත්‍රය අහෝසි කරනු ලැබේ.

5.පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන වෙත නිකුත් කර ඇති වලංගු බලපත්‍රය වෙනත් අයකුට පැවරිය නොහැක. එසේ පවරනු ලබන බලපත්‍ර බල ශූන්‍ය හා බල රහිත වේ.

6.ආරක්ෂක කළමනාකරුවෙකු ලෙස සුදුසු කම් සපුරා ඇති අයෙකුට ආරක්ෂක කළමනාකරුවෙකු ලෙස සේවය කල හැක්කේ එක්. ආරක්ෂක ආයතනයක පමණි. එසේ වෙනත් ආයතනයක සේවය කරනු ලබන බව දැනගතහොත් බලපත්‍රය අවලංගු කරනු ලැබේ.

7.පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායාතන ආරක්ෂක කළමනාකරු වයස අවුරුදු 75 නොඉක්ම වූ අයෙකු විය යුතුයි.

8.ව්‍යාපාර නාමය/ ලිපිනය/ ව්‍යාපාර හිමිකරු/ආරක්ෂක කළමනාකරු වෙනස් වන අවස්ථාවන්හිදී වහාම මෙම අමාත්‍යාංශය දැනුවත් කල යුතුයි.

9.ගිනි අවි භාවිතා කරන සියළුම ආරක්ෂක නියෝජ්‍යායතන, එම ගිනි අවි ගබඩා කිරීම සඳහා නියමිත ප්‍රමිතියට අනුව ආරක්ෂිත අවි ගබඩාවක් තිබිය යුතු අතර කිකුත් කිරීම්,භාර ගැනීම් නිසියාකාරව, ලේඛනයන්හි පවත්වා ගෙන යායුතුය.

10. සෑම ගිනිඅවියක් සඳහා ම බලපත්‍ර හා මුරකරු බලපත්‍ර ලබාගත යුතු අතර ගිනිඅවි අව භාවිතා කරනු ලබන බව වාර්ථා වුවහොත් ආරක්ෂක කළමනාකරු සහ ආයතන හිමිකරු ගිනිඅවි පනත යටතේ වරදකරු වේ.

11.ආරක්ෂක නිලධාරීන් සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් අනුමත නිල ඇඳුම් පමණක් භාවිතා කල යුතු අතර , වෙනත් නිල ඇඳුම් භාවිතා කිරීම බලපත්‍රය අවලංගු කිරීමට හේතු වේ.

12. ආරක්ෂක නිලධාරීන්ගේ සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල අදාල ගෙවීම් හා අයකිරීම් කම්කරු දෙපාර්තුමේන්තුව, මහ බැංකුව හා අනෙකුත් කම්කරු නීති වලට අනුකුලව පවත්වා ගෙන යා යුතුය.

13.වැටුප් හා දීමනා ගෙවීම පඩි පාලක සභාවේ නිර්නායකයන්ට අනුකූල විය යුතුයි.

14.ආරක්ෂක නිලධාරීන් මනා සෞඛ්‍යය තත්වයෙන් සිටිය යුතු අතර ඔවුන්ගේ උපරිම වයස් සීමාව අවුරුදු 68 වේ.

15.ගිනිඅවි භාවිතයට මුරකරු බලපත්‍ර ලබා දිය යුත්තේ විධිමත් පරිදි විශ්‍රාම ගත්තා ලද හමුදා සහ පොලිස් නිලධාරීන්ට පමණක් විය යුතු අතර අනෙක් ආරක්ෂක භටයින්ට ලබා දෙන්නේ නම් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් නිසි ගිනිඅවි පුහුණුවක් ලබා දිය යුතුය.

16. ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වල ප්‍රසම්පාදන කටයුතු සඳහා ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බවට තහවුරු වුවහොත් බලපත්‍රය අහෝසි කරනු ලැබේ.

17. ආයතන නිසිපරිදි බදු මුදල් (Tax) ගෙවිය යුතු වේ.

18. බලපත්‍රය අළුත් කිරීමේ දී සේවක අර්ථ සාධක අරමුදල් ගෙවීම් සහ බදු මුදල් (Tax) ගෙවීම් තහවුරු කිරිමට නිශ්කාෂන ඉදිරිපත් කල යුතුයි.

ඩී.එම්.සමන් දිසානායක
අතිරේක ලේකම්
(සිවිල් ආරක්ෂක හා සංවර්ධන)
පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන පිළිබඳ
නිසි බලධරයා